# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,727/11 – 1966 දෙසැම්බර් 30 වැනි සිකුරාදා – 1966 12 30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයන් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

## ආණ්ඩුවේ නිවේදන

එල්. සී.—බී. 43/48.

අ. ආ. කා. අංක : සී. 293/65.

### 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

#### 82 වන වගන්තිය යටතේ වූ වාර්තාවයි

අංක 17 දරන කොලොන්නාව මැතිවරණ දිස්ත්‍රික්කය සඳහා දොන් සේනාධීර සමරසිංහ තෝරා පත්කර ගැනීම ගැන පැමිණිලි කරන ඡන්ද පෙත්සම විභාග කළ මැතිවරණ විනිශ්චයකාරවරයා විසින් සකස් කරනු ලැබූ වාර්තාවේ පරිවර්තනයෙහි පිටපතක් 1961 අංක 72 දරන පනතින් සංශෝධිත (381 වැනි අධිකාරය වන) 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවෙහි 82 ඇ (2) (අ) වන වගන්තියෙන් නියම කර ඇති පරිදි මෙහි පහත ප්‍රසිද්ධ කරනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරවරයාගේ ලේකම්.

1966 දෙසැම්බර් 27 වන දින,
කොළඹ දී ය.

### 1965 අංක 6 දරන ඡන්ද පෙත්සම

#### අංක 17 දරන මැතිවරණ දිස්ත්‍රික්කය—කොලොන්නාව

#### 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවෙහි 82 වන වගන්තිය අනුව වූ වාර්තාවයි

1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවෙහි 82 වන වගන්තිය අනුව, 1965 අංක 6 දරන ඡන්ද පෙත්සම පිළිබඳ නඩු විභාගය අවසානයේ දී—අංක 17 දරන මැතිවරණ දිස්ත්‍රික්කය නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙහි නියෝජනය කිරීම පිණිස මන්ත්‍රීවරයකු තෝරා පත්කර ගැනීම සඳහා 1965 මාර්තු 22 වන දින පවත්වනු ලැබූ මැතිවරණයේ දී අපේක්ෂකයකු වූ දොන් සේනාධීර සමරසිංහ විසින්, එකී පාර්ලිමේන්තු මැතිවරණ රාජසභා ආඥාවේ 57 (ආ) වන වගන්තියෙහි අර්ථානුකූලව, අල්ලස් වැරදි තුනක්, එනම්—

(1) හෙට්ටිආරච්චිගේ සිරිසේන නැමැත්තකුගේ ඡන්දය ලබා ගැනීම සඳහා ඔහු පෙළඹවීම පිණිස, කොළඹ පවත්වනු ලැබූ රජයේ කර්මාන්ත ප්‍රදර්ශනයෙහි රක්ෂාවක්, 1964 දෙසැම්බර 20 වන දින හා 1965 ජනවාරි 2 වන දින අතර එකී සිරිසේනට ඔහු විසින් ලබා දීම ;

(2) බී. එම්. කුරේ නැමැත්තකුගේ ඡන්දය ලබා ගැනීම සඳහා ඔහු පෙළඹවීම පිණිස, කොළඹ පවත්වනු ලැබූ රජයේ කර්මාන්ත ප්‍රදර්ශනයෙහි රක්ෂාවක්, 1965 ජනවාරි 8 වන දින හා 10 වන දින අතර එකී කුරේට ඔහු විසින් ලබා දීම ;

(3) එම්. ජී. ධර්මදාස නැමැත්තකුගේ ඡන්දය ලබා ගැනීම සඳහා ඔහු පෙළඹවීම පිණිස කොළඹ පවත්වනු ලැබූ රජයේ කර්මාන්ත ප්‍රදර්ශනයෙහි රක්ෂාවක්, 1965 ජනවාරි 10 වන දින හා 14 වන දින අතර එකී ධර්මදාසට ඔහු විසින් ලබා දීම,

සිදුකොට ඇතැයි ඔප්පුවී ඇති බව, මම මෙයින් වාර්තා කරමි.

එක්වාදහස් නවසිය හැට හයේ ජූනි මස විසිතුන් වන ගුරු දින මගේ අත්සන යටතේ කොළඹ දී දෙන ලදී.

ටී. ඇස්. ප්‍රනාන්දු,
මැතිවරණ විනිශ්චයකාරවරයා.

12-1466/1

---

ඇල්. සී.—බී. 43/48.

අ. ආ. කා. අංක : සී. 293/65.

### 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

#### 82 ඇ (1) (ආ) වන වගන්තිය යටතේ වූ දැන්වීම යි

අංක 17 දරන කොලොන්නාව මැතිවරණ දිස්ත්‍රික්කය සඳහා මන්ත්‍රීවරයා වශයෙන් දොන් සේනාධීර සමරසිංහ මහත්මයා තෝරා පත් කර ගැනීම ගැන පැමිණිලි කරන ඡන්ද පෙත්සම විභාග කළ මැතිවරණ විනිශ්චයකාරවරයා විසින්, දොන් සේනාධීර සමරසිංහ මහත්මයා තෝරා පත් කර ගැනීම අවලංගු වූයේ යයි තමා විසින් නිශ්චය කරන ලද බව (381 වැනි අධිකාරය වන) 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 81 වැනි වගන්තිය යටතේ සහතික කර ඇති හෙයින්, එකී රාජසභා ආඥාවෙහි 27 වන වගන්තිය සමඟ කියවිය යුතු 82 ඇ (1) (ආ) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අග්‍රාණ්ඩුකාර විලියම් ගොපල්ලව වන මම, මේ දැන්වීමෙන්—

(1) ඉහත කී මැතිවරණ දිස්ත්‍රික්කයෙහි මැතිවරණයක් පවත්වන ලෙස අණ කරමි, තවද

(2) ඒ මැතිවරණය සඳහා අපේක්ෂකයන්ගේ නාම යෝජනා කිරීමේ දිනය වශයෙන් 1967 ජනවාරි 21 වන දිනය ද, ස්ථානය වශයෙන් කොළඹ කච්චේරිය ද නිශ්චිතව සඳහන් කරමි.

ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාරවරයා.

1966 දෙසැම්බර 28 වැනිදා,
මහනුවරදී ය.

12-1466/2


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

1052/37—ආර් ආර් 119—10,006 (66/12)